**Ingeborg von Zadow, BESUCH BEI KATT UND FREDDA**
**Singhalesische Übersetzung von Jayalath S.Gomes / M.Safeer**

## Excerpt VISITING KATT AND FREDDA

# උපුටා ගැනීම් කැට් සහ ෆ්‍රෙඩා

## පරිවර්තනය ජයලත් එස්. ගෝමස් /එම්. සෆීර්

ෆ්‍රෙඩා ෆ්‍රෙඩා මෙතන හරි ශොක්

කැට් ඔව්

ෆ්‍රෙඩා කලබලයක් නැහැ.

කැට් ඔව්.

ෆ්‍රෙඩා නිශ්චලයි.

කැට් ඔව්

ෆ්‍රෙඩා නිරවුල්.

කැට් ඔව්.

ෆ්‍රෙඩා අපි දෙන්නා විතරක්.

*විරාමයක්.*

කැට් ඔයා හිතන්නේ ඒක ඒ විදියට තියෙයි කියලද?

ෆ්‍රෙඩා ඔව්.

කැට් අපි දෙන්න විතරක්.

ෆ්‍රෙඩා ඔව්.

කැට් හැම තිස්සෙම අපි දෙන්න විතරක්.

ෆ්‍රෙඩා ඔව්.

කැට් හැම තිස්සෙම අපි දෙන්න විතරක්ම?

ෆ්‍රෙඩා ඇයි නැත්තේ?

*විරාමයක්.*

කැට් කවුරු හරි එන්න පුළුවන්.

ෆ්‍රෙඩා අපොයි නැහැ. නාවොත් හොඳයි.

කැට් ඇයි? ඔයා අමුත්තන්ට අකමැතිද?

ෆ්‍රෙඩා හැම දෙයක්ම සංකීර්ණ වෙනවා.

කැට් ඇයි සංකීර්ණ වෙන්නේ?

ෆ්‍රෙඩා අමුත්තා කොහෙද ඉන්නේ? අපි දෙන්නට විතරයි ඉඩ තියෙන්නේ. තුන්දෙනෙක්ට ඉඩ නැහැ. මට එක සෝපාවක් සහ අනික ඔයාට.

කැට් තුන්දෙනෙක්ට ඉඩ තියෙනවා. අපිට ලං වෙන්නයි තියෙන්නේ.

ෆ්‍රෙඩා මාව විශ්වාස කරන්න. කැට්. මේ විදිය හොඳයි.

කැට් ඔයා බයයි ඔයා ආස කරන දේවල් එහා මෙහා වේවි කියලා.

ෆ්‍රෙඩා මං ආස කරන දේවල්?

කැට් ඔයා ආස දේවල්.

ෆ්‍රෙඩා ඇයි ඔයා ආස දේවල්. ඔයාගේ දේවල් කොහෙද තියෙන්නේ කියල දැන ගන්න එක හොඳයි.

©VERLAG DER AUTOREN GmbH & Co. KG, Taunusstraße 19,
60329 Frankfurt a.M., Germany, Tel. +49 [0]69 23857420
www.verlagderautoren.de, theater@verlagderautoren.de